**1.තොරතුරු සඳහා ඇති ප්‍රවේශය:**

ජනතාවට අවශ්‍ය තොරතුරු බාධාවකින් තොරව ලැබීමට ඇති හැකියාව මින් අදහස් වේ. තොරතුරු සුලභ බව මෙන්ම තොරතුරු ලබා ගැනීමේ මාධ්‍යයන් බාධාවකින් තොරව සමාජය තුල ක්‍රියාත්මකවන බව මින් අදහස්වේ.
විශේෂයෙන්ම ජන මාධ්‍ය වාරණයකින් හෝ බාධාවකින් තොරව හා නිදහස්ව හා බලපෑමෙන් තොරව හැසිරීම මෙහිදී වඩාත්ම වැදගත් වේ.

**2.තොරතුරු ප්‍රසිද්ධ කිරීම සඳහා රාජ්‍යමය ආයතනවලට ඇති වගකීම**

ජනතාවට වැදගත් වන සියළු තොරතුරු ජනතාවට ලබා ගත හැකි පහසු මාධ්‍යයන්ගෙන් ජනතාවට ලබා දීමට රාජ්‍ය  ආයතන වලට වගකීමක් තිබිය යුතුය. ජනතාවට බහුලව ලබා ගත හැකි මාධ්‍යයන්ගෙන් මෙන්ම ජනතාවට තේරුම් යන ලෙස සරල ලෙස එම තොරතුරු ලබා දීම රජයේ වගකීමකි.

**3.තොරතුරු ඉදිරිපත් කිරීමට ඇති වගකීම**

යම් යම් පුද්ගලයන්ට අදාල වන තොරතුරු ඉල්ලා සිටිවිට එම තොරතුරු ලබා දීමට ඇති බැදීම මෙයින් අදහස් වේ. රාජ්‍ය රහස් වැනි සීමාවන්ට යටත්ව තොරතුරු රාජ්‍ය ආයතන වලින් ඉල්ලා සිටීමේ අයිතියක් ජනතාවට තිබිය යුතුය. ජනතාවට අදාල වන පෞද්ගලික තොරතුරු හා ජනතාවගේ බදු මුදල් වලින් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ජනතාවට ලබාදීමේ වගකීමක් රාජ්‍ය නිළධාරීන්ට ඇත. මෙම තොරතුරු ප්‍රමාදයකින් තොරව හා නිවැරදිව ජනතාවගේ අයිතියකි.